අකුරැස්ස ප්‍රාදේශීය සභාව,
මාතර දිස්ත්‍රික්කය.
-------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 මාර්තු 29 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 25 දිනද, විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 මැයි 31 දිනද සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2018 දෙසැම්බර් 31 දිනට අකුරැස්ස ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

### 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

#### (අ) ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | 2016 වර්ෂයේ සිට මුදල් පොතේ පැවති රු.61,881 ක් වූ ශේෂය ඉකුත් වර්ෂයේ සමුච්චිත අරමුදලට කපාහැර තිබීම සමාලෝචිත වර්ෂයේදීද නිවැරදි කර නොතිබුණි. | නිවැරදිව ගිණුම් ගත කළ යුතුවේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ii) | ගිවිසුම් ඇප තැන්පත් ගිණුමෙහි හා මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර තිබූ උපලේඛන අතර වෙනස වූ රු.73,800 ක් ඉකුත් වර්ෂයේදී හඳුනාගැනීමකින් තොරව සමුච්චිත අරමුදලට ගැලපීම් කිරීම සමාලෝචිත වර්ෂයේදීද නිවැරදි කර නොතිබුණි. | නිවැරදිව ගිණුම් ගත කළ යුතුවේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (iii) | සමාලෝචිත වර්ෂය අවසානයට කර්මාන්ත ණයහිමි ශේෂය රු.977,049කින් වැඩියෙන් දැක්වුණි. | ණයහිමියන් නිවැරදිව ගිණුම් ගත කළ යුතුවේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

| | | | |
|---|---|---|---|
| (iv) | ණයහිමි ප්‍රතිපාදන සලසා නොතිබූ විගණන ගාස්තු රු.152,214 ක් සමාලෝචිත වර්ෂයේදී ණයහිමියන්ගෙන් ගෙවා තිබුණි. | නිවැරදිව ගිණුම් ගත කළ යුතුවේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (v) | සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතු ස්ථාවර තැන්පත් පොලී රු.34,298 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | නිවැරදිව ගිණුම් ගත කළ යුතුවේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (vi) | නිශ්චිතව හඳුනා නොගෙන කර්මාන්ත ණයහිමියන් සඳහා 2014 වර්ෂයේදී රු.1,466,587 ක ප්‍රතිපාදන සලසාගෙන තිබූ අතර සමාලෝචිත වර්ෂයේදීද එය නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි. | ණයහිමියන් නිවැරදිව ගිණුම් ගත කළ යුතුවේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (vii) | සමාලෝචිත වර්ෂය අවසානයට කර්මාන්ත ණයගැති ශේෂය රු.160,739 ක් අඩුවෙන් දක්වා තිබුණි. | ණයගැතියන් නිවැරදිව ගිණුම් ගත කළ යුතුවේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

(ආ) **නොසැසඳුණු ගිණුම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් එකතුව රු.33,962,434 ක් වූ ගිණුම් විෂයයන් 09 කට අදාළ ශේෂ හා ඊට අදාළ උපයෝගී ලේඛන/උපලේඛනවල දැක්වෙන ශේෂ අතර, එකතුව රු.10,682,576 ක අසමානතා පැවතුණි. | අදාළ ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුවේ. | ගිණුම්ගත ශේෂ හා ලේඛනගත ශේෂ අතර වෙනසට හේතු හඳුනාගෙන ඒවා ජර්නල් සටහන් මඟින් නිවැරදි කිරීමට ඉදිරියේදී කටයුතු කරමි. |

(ඇ) **විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.79,429,494 ක්වූ ගිණුම් විෂයයන් 04 ක් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය. | මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතුවේ. | ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාමට කටයුතු කිරීම සහ අදාළ ශේෂ සනාථ කිරීමේ ලිපි ඉදිරිපත් කරමි. |

## 1.4 අනුකූල නොවීම්

-------------------

### 1.4.1 නීති, රීති, රෙගුලාසි හා කළමණාකරණ තීරණවලට අනුකූල නොවීම්

-----------------------------------------------------------------------------

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත | | | |
| (i) 49 හා 52 වගන්ති | යොමුගත වගන්ති ප්‍රකාරව අනවසර ඉදි කිරීම් සම්බන්ධයෙන් විධිමත් පරිදි කටයුතු කර නොතිබුණි. | පනත ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | අනවසර ඉදිකිරීම් සම්බන්ධයෙන් ඉදිරියේදි නඩු පැවරීමට කටයුතු කරමි. |
| (ii) 150 (4) වගන්තිය | සභාවට අයත් ආදායම් අයකිරීම සඳහා සභාවේ ලේකම්ගේ අවධානය යොමු වී නොතිබුණි. | පනත ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | තවදුරටත් ගෙවීම් පැහැර හරින්නන් සම්බන්ධයෙන් සන්තකය පවරා ගැනීමට හා දේපළ තහනම් කිරීමට ඉදිරියේදී කටයුතු කරමි. |
| (ආ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති | | | |
| රීති 193 | අයවැයගත හා පරිපූරක සම්මත වැය සමග වැය විෂයයන්හි තථ්‍ය වියදම් සසඳා අතිරික්ත හා ඌනතා පිළිබඳ හේතු දැක්වෙන ප්‍රකාශයක් ගිණුම් සමඟ ඉදිරිපත් කර නොතිබුණි. | රීති ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | 2019 අවසන් ගිණුම් සකස් කිරීමේ දී ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. |
| (ඇ) 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඑ්අයි 2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | පරිගණක උපාංග හා මෘදුකාංග සම්බන්ධයෙන් චක්‍රලේඛය ප්‍රකාරව ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | 2019 වර්ෂයේ සිට එම ලේඛනය යාවත්කාලීන කර ක්‍රමවත්ව පවත්වාගෙන යාමට කටයුතු කරමි. |

| | | | |
|---|---|---|---|
| (ඇ) දකුණු පළාත් පාලන කොමසාරිස්ගේ දපපා/පපාකො/ 2010/01 චක්‍රලේඛය | චක්‍රලේඛය ප්‍රකාරව බිම් අල්ලි කඩ කාමර 26 ක හා කඩ කාමර 62 ක ගිවිසුම් යාවත්කාලීන කර නොතිබූ අතර බිම් අල්ලි කඩ කාමර 11 ක් සම්බන්ධව ගිවිසුම්ගත වී නොතිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | මෙම බිම්බදු හා කඩ කාමර සම්බන්ධ සමීක්ෂණයක් සිදු කර ඇති අතර එහි වාර්තාව මැයි මස මහා සභාවට ඉදිරිපත් කර සභා තීරණය අනුව ඉදිරි කටයුතු කරමි. |

## 2. මූල්‍ය සමාලෝචනය

-----------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදමට වඩා වැඩිවූ ආදායම රු.12,940,635 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු. 11,364,504 ක් විය.

**2.2** **ආදායම් පරිපාලනය**

**2.2.1** **ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්**

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2018 | | | | 2017 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 2,012,000 | 2,168,357 | 1,990,568 | 1,547,979 | 2,215,305 | 2,176,276 | 2,072,989 | 1,370,190 |
| කුලී | 3,600,000 | 3,363,845 | 2,834,789 | 7,337,537 | 3,475,000 | 3,104,391 | 6,889,710 | 6,808,481 |
| බලපත්‍ර ගාස්තු | 1,875,000 | 1,717,457 | 1,717,457 | -- | 1,800,000 | 1,528,022 | 1,528,022 | -- |
| වෙනත් ආදායම් | 16,500,000 | 15,740,689 | 9,145,408 | 28,858,469 | 18,000,000 | 11,510,557 | 10,694,640 | 22,263,188 |
| **එකතුව** | 23,987,000 | 22,990,348 | 15,688,222 | 37,743,985 | 25,490,305 | 17,503,329 | 21,185,361 | 30,441,859 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තුගත ආදායම රු.23,987,000 ක් විය. සමාලෝචිත වර්ෂයේ ආරම්භයට තිබූ රු.30,441,859 ක හිඟ මුදල හා බිල්කිරීම් රු.22,990,348 ක් සමඟ රු.53,432,207 ක් අයවීමට තිබූ අතර වර්ෂය තුලදී මුළු අයවීම් රු.15,688,222 ක් වීම නිසා සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතු හිඟ මුදල රු.37,743,985 ක් විය. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුවේ. | මුද්දර ගාස්තු හා උසාවි දඩ මුදල් ප්‍රධාන ලේකම් වෙතින් ලබා ගැනීම සඳහා ඉල්ලීම් කර ඇත. මුළු හිඟ ආදායම මෙතරම් ඉහල අගයක් ගෙන ඇත්තේ මුද්දර ගාස්තු හා උසාවි දඩ වල හිඟය ඉහල අගයක් (42%) වීම නිසාවේ. |

### 2.2.3 වරිපනම් හා බදු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| **(අ) වරිපනම්** | | |
| සමාලෝචිත වර්ෂයේ ආරම්භයට හිඟ වරිපනම් බදු ශේෂය රු.1,332,189 ක් වූ අතර, රු.2,276,694 ක් වූ වර්ෂයේ බිල්කිරීම් සහ අධි ගාස්තු සමග රු.3,608,863 ක් අයවිය යුතුව තිබුණි. වර්ෂය තුලදී මුළු අයවීම් රු.1,977,088 ක් වීම නිසා වර්ෂය අවසානයට රු.1,631,795 ක හිඟ ශේෂයක් පැවතුණි. මුළු අයවීම්, ආරම්භක හිඟයෙන් හා බිල්කිරීම්වලින් සියයට 55 ක් විය. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුවේ. | දේපළ තහනම් කිරීමේ නිලධාරී වශයෙන් ආදායම් පරීක්ෂක නිලධාරීන් පත් කර ඔවුන් මගින් හිඟ මුදල් අය කර ගැනීමට කටයුතු ආරම්භ කර ඇත. |
| **(ආ) අක්කර බදු** | | |
| ආරම්භක හිඟ අක්කර බදු ශේෂය රු.38,002 ක් වූ අතර, වර්ෂයේ බිල්කිරීම් රු.15,535 ක් විය. සමාලෝචිත වර්ෂය තුළ මුළු අයවීම් රු.13,480 ක් වූයෙන්, වර්ෂය අවසානයට රු.40,057 ක් හිඟව පැවතුණි. මුළු අයවීම්, ආරම්භක හිඟයෙන් හා බිල්කිරීම්වලින් සියයට 25 ක් විය. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුවේ. | අක්කර බදු ලේඛනයේ අඩංගු දේපළ විශාල වශයෙන් කැබලි කර ඇති බැවින් දේපල හඳුනාගැනීම සඳහා සමීක්ෂණයක් කිරීමට කටයුතු යොදා ඇත. |

| | | |
|---|---|---|
| | | හිඟ මුදල් අය කර ගැනීමට ද කටයුතු ආරම්භ කර ඇත. |

**2.2.4 කුලී**

-----

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| **(අ) කඩ කුලී** | | |
| ආරම්භක හිඟය රු.6,258,563 ක් වූ අතර, රු.2,989,379 ක් වූ වර්ෂයේ බිල්කිරීම් හා අධි ගාස්තු සමග රු.9,247,942 ක් අයවිය යුතුව තිබුණි. වර්ෂය තුලදී මුළු අයවීම් රු.2,545,600 ක් වීම නිසා, වර්ෂය අවසානයට රු.6,702,342 ක හිඟ ශේෂයක් පැවතුණි. මුළු අයවීම්, ආරම්භක හිඟයෙන් හා බිල්කිරීම්වලින් සියයට 28 ක් විය. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුවේ. | හිඟ ශේෂයෙන් රු.153,543 ක මුදලක් 2019 මාර්තු 31 දින වන විට අය කර ගැනීමට කටයුතු කර ඇති අතර සමීක්ෂණයක් සිදු කර ඒ තුළින් හඳුනා ගත් අඩුපාඩු නිවැරදි කිරීමටත් දිගින් දිගටම හිඟ කුලී පවතින ස්ථානවල සන්තකය ආපසු ලබා ගැනීමට හා ඔවුන්ට එරෙහිව නීතිමය පියවර ගැනීමට ඉදිරියේදී කටයුතු කරමි. |
| **(ආ) බිම් බදු** | | |
| ආරම්භක හිඟය රු.549,918 ක් වූ අතර, රු.374,466 ක් වූ වර්ෂයේ බිල්කිරීම් හා අධි ගාස්තු සමග රු.924,384 ක් අයවිය යුතුව තිබුණි. මුළු අයවීම් රු.289,189 ක් වීම නිසා, වර්ෂය අවසානයට රු.635,195 ක හිඟ ශේෂයක් පැවතුණි. මුළු අයවීම්, ආරම්භක හිඟයෙන් හා බිල්කිරීම්වලින් සියයට 31 ක් විය. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුවේ. | හිඟ බිම් බදු අයකර ගැනීම සඳහා ද සමීක්ෂණයක් සිදු කර ඇති අතර සමීක්ෂණ මණ්ඩල තීරණ 2019 මැයි මස මහා සභාව වෙත යොමු කර ඇත. ඒ අනුව අවශ්‍ය තීරණ ගෙන හිඟ මුදල් අයකර ගැනීමට ඉදිරියේදී කටයුතු කරමි. |

**2.2.5 වෙනත් ආදායම්**

**-----------------**

**උසාවි දඩ හා මුද්දර ගාස්තු**

**----------------------------**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ------------------------ | ------------- | ----------------- |
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ අවසානයට උසාවි දඩ රු.3,913,906 ක් හා මුද්දර ගාස්තු රු. 24,944,563 ක් ලැබිය යුතුව තිබුණි. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුවේ. | AK/PS/02/03/07 හා 2019 ජනවාරි 02 දිනැති ලිපිය මගින් හිඟ මුද්දර ගාස්තු හා උසාවි දඩ මුදල් ලබා දෙන ලෙස ඉල්ලීමක් කර ඇති බව සහ එම ඉල්ලීමට අනුව හිඟ උසාවි දඩ මුදලින් රු.2,032,673 ක මුදලක් ද හිඟ මුද්දර ගාස්තු වලින් රු.467,327ක මුදලක් ද 2019 පෙබරවාරි 06 දින ලැබී ඇත. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**------------------------------**

**3.1 කාර්ය සාධන ඇගයීම**

**--------------------------**

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

**(අ) අතුරු ව්‍යවස්ථාව**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (i) 1988 අගෝස්තු 23 දිනැති අංක 520/7 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් නිකුත් කළ මාළු විකිණීම සඳහා වූ අතුරු ව්‍යවස්ථාව වැළදගෙන තිබීම නිසා වාර්ෂික ටෙන්ඩර් මගින් ලබාදීම වෙනුවට, අකුරැස්ස පොදු වෙළඳපොලේ කඩ කාමර 07 ක් එක් කඩ කාමරයක් මාසිකව රු.750 ක් බැගින් මාළු විකිණීම වෙනුවෙන් ලබා දි තිබුණි. | අතුරු ව්‍යවස්ථා ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | පොදු වෙළඳපොල මාළු ලැලි 07 දිර්ඝකාලීන බදු ක්‍රමය යටතේ ලබා දීමට තීරණය කර ඇත්තේ එවකට පැවති මහා සභාව විසින් බවත් ඉදිරියේ දී නීත්‍යානුකුල තත්ත්වය සම්බන්ධයෙන් සොයා බලා සභාවට වාසිදායක ක්‍රමවේදයක් කරා යොමු වීමට කටයුතු කරමි. |
| (ii) කසළ බදු අය කිරීම සඳහා 2002 වර්ෂයේ සිට අතුරු ව්‍යවස්ථා පනවාගෙන තිබුණද රෝහල්, කර්මාන්තශාලා, නිවාස සංකීර්ණ හා මාංශ අලෙවිසැල්වලින් කසළ එකතු කිරීම වෙනුවෙන් කිසිදු බදු මුදලක් අය කිරීමට කටයුතු කර නොතිබුණි. | අතුරු ව්‍යවස්ථා ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | කසල බදු අය කල යුතු මට්ටමේ ව්‍යාපාරික ස්ථාන නොමැති නිසාත්, වරිපනම් බදු අය කරනු ලබන භූමි භාගය තුල කසල එකතු කරනු ලබන බැවිනුත්, කසල බදු පැනවීමට නොහැකිවී ඇත. |

**(ආ) ක්‍රියාකාරී සැලැස්ම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| පනවා තිබුණු අතුරු ව්‍යවස්ථා අනුව සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යයන් සියල්ලම වෙනුවෙන් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කළ යුතුවේ. | අකුරැස්ස ප්‍රාදේශීය සභාව විසින් 2018 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොමැත. නමුත් 2019 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර මේ වන විට එම සැලැස්ම ක්‍රියාත්මක මට්ටමේ පවතී. |

(ඇ) **ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය තුළ ඝන අපද්‍රව්‍ය කළමනාකරණය වෙනුවෙන් වැටුප් හා දීමනා, ඉන්ධන හා වාහන අළුත්වැඩියා වෙනුවෙන් රු.4,967,104 ක වියදම් දරා තිබුණද රැස් කරනු ලබන කසළවලින් නොදිරන කසළ මාතර මහා නගර සභාවට අයත් කොටවිල පිහිටි කසළ අංගනය වෙත භාරදීම සිදු කෙරෙන අතර දිරන කසළ අකුරැස්ස නගරයේ පෞද්ගලික ඉඩමකට බැහැර කරමින් තිබුණි. | කොම්පෝස්ට් අංගනයේ කටයුතු ආරම්භ කර විධිමත් ලෙස කසල බැහැර කළ යුතුවේ. | කොම්පෝස්ට් අංගනයට ප්‍රවේශ වීමට භාවිතා කරන මාර්ගයේ වාහන දෙකකට මාරු වීමට ප්‍රමාණවත් ඉඩකඩ නොමැති බැවින් මාර්ගය පුළුල් කිරීම් කටයුතු අවසාන වූ වහාම කොම්පොස්ට් අංගනයේ කටයුතු ආරම්භ කිරීමට කටයුතු කරමි. |

(ඈ) **තිරසර සංවර්ධන ඉලක්ක**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| තිරසර සංවර්ධනය සඳහා වන 2030 න්‍යාය පත්‍රයේ , තිරසර සංවර්ධන අරමුණු සහ ඉලක්ක සඳහා වන ගෝලීය දර්ශක තුලින් සහා බල ප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්ත්වය සහ සෞඛ්‍ය නංවාලීම සඳහා වන දිගුකාලීන සැලසුම් සභාව විසින් සකස් කර නොතිබුණි. | තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක ළඟාකරගැනීමට වැඩසටහන් සැලසුම්කර ක්‍රියාත්මක කළ යුතුවේ. | තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක සම්බන්ධව මහජන නියෝජිතයින් හා නිලධාරීන් දැනුවත් කොට සභා බල ප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්ත්වය සහ සෞඛ්‍ය නංවාලීම සඳහා වන දිගුකාලීන සැලසුම් සකස් කිරීමට කටයුතු කරමි. |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) නාගරික සංවර්ධන අධිකාරියේ සභාපති විසින් ප්‍රාදේශීය සභා වෙත යොමු කරන ලද අංක 05/02/01/10 දරන 2017 දෙසැම්බර් 04 දිනැති සැලසුම් චක්‍රලේඛ අංක 27 ප්‍රකාර අනවසර ඉදිකිරීම් සම්බන්ධයෙන් නඩු පැවරීම හා ඊට අනුශාංගික සියළු කටයුතු සඳහා බලතල සභාව වෙත පවරා තිබියදීත් 2018 සැප්තැම්බර් 18 දිනැති නාගරික සංවර්ධන අධිකාරියේ මාතර නියෝජ්‍ය අධ්‍යක්ෂ (සැලසුම්) ගේ ලිපිය මගින් සභාවට දන්වා තිබූ අනවසර ඉදිකිරීම් 07 ක් සම්බන්ධයෙන් නීත්‍යානුකූලව කටයුතු කර නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | නියමිත කොන්දේසි ඉටුකර නොමැති බවට තහවුරු වන්නේ නම් ඉදිකිරීම් සම්බන්ධව නීත්‍යානුකූලව කටයුතු කරමි. |
| (ආ) අකුරැස්ස නාගරික බල ප්‍රදේශය තුළ ඉදිකරන ලද අනවසර ඉදිකිරීම් 15 ක් සම්බන්ධයෙන් නීත්‍යානුකූලව කටයුතු කර නොතිබූ අතර ආවරණ අනුමැතිය ලබාදිය හැකි ගොඩනැගිලි සම්බන්ධයෙන් ගාස්තු අය කර ආවරණ අනුමැතිය ලබා දීමටද කටයුතු කර නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | නියමිත කොන්දේසි ඉටුකර නොමැති බවට තහවුරු වන්නේ නම් ඉදිකිරීම් සම්බන්ධව නීත්‍යානුකූලව කටයුතු කරමි. |

## 3.3 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (ආ) **සේවක පුරප්පාඩු හා අතිරික්ත** | | |
| අනුමත තනතුරුවල පැවති පුරප්පාඩු 18 ක් සම්පූර්ණ කර ගැනීමටත්, 08 ක්වූ අතිරික්ත සේවක සංඛ්‍යාව විධිමත් කර ගැනීමටත් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් කටයුතු කර නොතිබුණි. | කාර්ය මණ්ඩලයේ අතිරික්ත තනතුරු විධිමත් කරගැනීම හා පුරප්පාඩු සම්පූර්ණ කර ගත යුතුවේ. | පුරප්පාඩු 2ක් සම්පූර්ණ වී ඇති අතර ඉතිරි පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා මේ වන විට |

| | | |
|---|---|---|
| | | කටයුතු කරමින් පවතී. |

(ආ) **සේවක ණය**

| | | |
|---|---|---|
| සේවක ණය ලේඛනය අනුව වාරික ගෙවීම් පැහැර හැර ඇති සේවකයින්ගෙන් අයවිය යුතු රු.163,003 ක්වූ හිඟ ණය ශේෂ අයකර ගැනීමට සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් කටයුතු කර නොතිබුණි. | කඩිනමින් හිඟ ණය ශේෂ අයකළ යුතුවේ. | ණය ශේෂයෙන් වර්ෂ 10කට වඩා වැඩි රු.53,212ක ණය මුදලක් ප්‍රධාන අමාත්‍යතුමාගේ අනුමැතිය යටතේ කපා හැරීමටත් වර්ෂ 10කට වඩා අඩු රු.280,387 ක ණය මුදලක් අය කර ගැනීමටත් ඉදිරියේදී කටයුතු කරමි. |

**3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2010 වසරින් පසු වරිපනම් දේපළ තක්සේරුව සිදු නොකිරීම නිසා නව ඉදිකිරීම්වලින් ගාස්තු අය කිරීමට නොහැකි වී තිබුණි. | පනත ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | වරිපනම් තක්සේරුවක් ලබා ගැනීම සඳහා 2017 වර්ෂයේ ප්‍රධාන අමාත්‍යතුමාගේ අනුමැතිය ලබා ගත් අතර 2017 වර්ෂයේ සිට තක්සේරු දෙපාර්තමේන්තුවෙන් වරිපනම් තක්සේරුව සිදු කර දෙන ලෙස ඉල්ලීම් කර ඇතත් මේ දක්වා එම ඉල්ලීම ඉටු වී නොමැත. |
| (ආ) | 2010 දෙසැම්බර් 27 දිනැති දකුණු පළාත් පාලන කොමසාරිස්ගේ දපපා/ පපාකො/2010/01 දරන චක්‍රලේඛය ප්‍රකාරව වසර 05 කට වරක් තක්සේරුගත බදු මුදල සංශෝධනය කළ යුතු වුවද, 2019 අප්‍රේල් 10 දින වන විටත් කඩ කාමර 79 කින් නව තක්සේරුව සිදුකර තිබුනේ කඩ කාමර 11 ක් සඳහා පමණි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | තක්සේරු කාල සීමාව ඉකුත්ව ඇති කඩ කාමර තක්සේරු කිරීම සඳහා ඉදිරියේදී කටයුතු කරමි. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ඉහත වක්‍රලේඛය ප්‍රකාරව එක්වන් මුදල උපරිම මාස 06 කට යටත්ව මාස 06 ක් ඇතුළත ගෙවිය යුතු වුවද ගිවිසුම්ගත කාලය අවසන් වී තිබූ කාමර 18 කින් 2019 අප්‍රේල් 10 දින වන විට රු.4,736,848 ක මුදලක් අයවිය යුතුව තිබුණි. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | මෙම කඩ කාමරවලින් කඩ කාමර 16ක සන්තකය පවරා ගැනීමේ කටයුතු සිදු වෙමින් පවතින අතර හිඟ මුදල් පවතින අනෙකුත් කඩ කාමර වල සන්තකය පවරා ගැනීමට ඉදිරියේ දී කටයුතු කරමි. |
| (ඈ) | 2005 වසරේ ඉදිකිරීම් කටයුතු අවසන් කර තිබූ අකුරැස්ස පොදු වෙළඳපොල කඩකාමර 12 ක් වසර 13 ක කාලයක සිට ටෙන්ඩර් කර නොතිබූ අතර ඉදිකර තිබූ කඩ කාමර 74 ක් සඳහා ප්‍රවේශ වන මාර්ගයට අවහිර වන පරිදි අනවසරයෙන් ඉදිකිරීම් කර තිබීම නිසා පාරිභෝගිකයන් වෙළඳපොලට පිවිසීම දුර්වල මට්ටමක පැවතුණි. මේ නිසා කඩ කාමර 41 ක් 2019 අප්‍රේල් 10 දින වන විටත් වසා තිබුණි. | අවහිරතා ඉවත් කර කඩකාමර ටෙන්ඩර් කර බදුදීම කළ යුතුවේ. | 2005 වර්ෂයේ ටෙන්ඩර් කර බදු දෙන ලද කඩ කාමරවලින් ඉතිරි කඩ කාමර කිහිප වරක් ටෙන්ඩර් කරන ලද නමුත් බදුකරුවන් ඉදිරිපත් නොවීය. |
| (ඉ) | නාගරික සංවර්ධන අධිකාරිය විසින් නිකුත් කර තිබූ අංක 392/7 හා 1986 මාර්තු 16 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රය ප්‍රකාරව අනුබෙදීම් කළ අක්කර 13 රූඩ් 02 පර්චස් 37.62ක (වීපී හැර) වපසරියෙන් යුතු ඉඩමෙන් සභාවට හිමි විය යුතු අක්කර 01 රූඩ් 01 පර්චස් 19 ක ඉඩම් කොටසෙන් සභාවට ලැබී තිබුනේ පර්චස් 41.44 ක් පමණි. | ගැසට් පත්‍රය ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | ඉඩමේ අනුබෙදුම සඳහා අනුමැතිය දී ඇත්තේ නිවාස හා නගර සංවර්ධන ආඥා පනත යටතේ බැවින් එම පනතේ ප්‍රජා හා විනෝද කටයුතු සඳහා වෙන් කල යුතු ඉඩම් ප්‍රමාණයන් නිශ්චිතව දක්වා නොමැති නිසා පර්චස් 41.44ක ප්‍රමාණයක් ලබා ගෙන ඇත. |
| (ඊ) | 2013 වර්ෂයේ ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ ජාතික වැඩ සටහන යටතේ සභා භූමිය තුළ වාහන ගාල් කිරීම සඳහා ගරාජයක් ඉදිකිරීම සඳහා රු.1,190,747 ක් වටිනා ඇස්තමේන්තුව පළාත් පාලන කොමසාරිස් විසින් නිර්දේශ කර තිබුණද 2019 අප්‍රේල් 10 දින වන විටත් වැඩ ආරම්භ කර නොතිබූ අතර රු.61,360,772 ක් වටිනා වාහන 18 ක් අව් වැසි වලට ලක්වෙමින් සභා භූමියේ ගාල් කර තිබුණි. | ඉදිකිරීම් කටයුතු කඩිනම් කළ යුතුවේ. | සභා භූමියේ හා ආදාහනාගාරය පිහිටි භූමියේ වාහන අංගන 02 ක් ඉදි කිරීමට අවශ්‍ය ඇස්තමේන්තු සකස් කර ඇති අතර පළාත් පාලන කොමසාරිස්ගේ අනුමැතිය ලැබුණු වහාම එහි ඉදි කිරීම් කටයුතු ආරම්භ කරමි. |

## 3.5 වත්කම් කළමණාකරණය

### 3.5.1 වත්කම් ලේඛනගත නොකිරීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව විසින් ඉකුත් වර්ෂයේ හා සමාලෝචිත වර්ෂයේ මිලදී ගෙන තිබූ එකතුව රු.652,437 ක්වූ ස්ථාවර වත්කම් ලේඛනගත කර නොතිබුණි. | සියළු වත්කම් ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුලත් කළ යුතුවේ. | මිල දී ගෙන ඇති එහෙත් ලේඛන ගත නොවූ සියලුම ස්ථාවර වත්කම් 2019 වර්ෂය තුළ ලේඛනගත කිරීමට කටයුතු කරමි. |

### 3.5.2 වත්කම්වල ආරක්ෂාව තහවුරු නොකිරීම

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | දකුණු පළාත්, පළාත් පාලන කොමසාරිස්ගේ අංක දපපා/15 හා 2007 මාර්තු 19 දිනැති උපදෙස් ලිපිය ප්‍රකාරව පළාත් පාලන ආයතන සතු සෑම දේපලකම ආරක්ෂාව තහවුරු කර ගැටළු සහගත තත්ත්වයේ ඇති ඉඩම් නැවත මැන මායිම් නිවැරදි කර ගැනීමට කටයුතු කළයුතු වුවද සභාව සතු ඉඩම් කැබලි 28 ක් සම්බන්ධයෙන් එසේ කටයුතු කර නොතිබුණි. | උපදෙස් ලිපිය ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | සභාව සතු ඉඩම් වල අයිතිය නිරවුල් කර ගැනිම සඳහා ඔප්පු සහ පිඹුරුපත් සකස් කිරීමේ කටයුතු ආරම්භ කර ඇති අතර ඉඩම්වල අයිතිය නිරවුල් කර ගැනීමෙන් අනතුරුව වැට මායිම් දැමීමට කටයුතු සිදු කරමි. |
| (ආ) | සභාව සතු ඉඩම් කැබලි 05 ක පෞද්ගලික පාර්ශවයන් විසින් අනවසරයෙන් කඩකාමර ඉදිකර දේපළ භුක්ති විඳිමින් පැවති අතර අනවසර ඉදිකිරීම් සම්බන්ධයෙන් සභාව විසින් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | කඩිනමින් අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුවේ. | සභාව සතු ඉඩම් කැබලි වල සිදු කර ඇති අනවසර ඉදිකිරීම් සම්බන්ධයෙන් සොයා බලා ඉවත් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරමි. |

### 3.5.3 නිෂ්ක්‍රීය/ඌණ උපයෝජිත වත්කම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) කිසිදු ප්‍රයෝජනවත් කටයුත්තකට යොදවා ගෙන නොතිබූ සභාව සතු ඉඩම් 16 ක් ඉඩම් එලදා බදු හෝ වාර්ෂික බදු ක්‍රමයට ලබාදී අමතර ආදායමක් ලබාගැනීමට අවධානය යොමු කර නොතිබුණි. | එලදායී කාර්යයක් සඳහා යොදාගැනීම හෝ ප්‍රයෝජනයට ගත නොහැකි නම් අපහරණ කිරීමට කටයුතු කළ යුතුවේ. | 2019 වර්ෂය සඳහා සභාව සතු ඉඩම් 04 ක් වාර්ෂික බදු ක්‍රමය යටතේ ලබා දීමට කටයුතු කර ඇත. |
| (ආ) සභාව සතු රු.645,000 ක් වටිනා ට්‍රැක්ටරය සහ රු.1,310,000 ක් වටිනා ඩබල් කැබ් රථය වර්ෂ 03 කට වැඩි කාලයක සිට නිෂ්ක්‍රීයව පැවති අතර භාණ්ඩාගාර ලේකම්ගේ 2015 ජුනි 10 දිනැති අංක 02/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි. | එලදායී කාර්යයක් සඳහා යොදාගැනීම හෝ ප්‍රයෝජනයට ගැනීමට නොහැකි නම් අපහරණ කිරීමට කටයුතු සිදු කළ යුතුවේ. | යාන්ත්‍රික ඉංජිනේරුගෙන් තක්සේරු වාර්තාවක් ලබා ගෙන ඇති අතර වෙන්දේසි කිරීමට ඉදිරියේදී කටයුතු කරමි. |

## 3.6 ප්‍රසම්පාදනය

### 3.6.1 ප්‍රසම්පාදන සැලැස්ම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්මක් නොමැතිව වර්ෂය තුළ මිලදී ගැනීම් වෙනුවෙන් රු.6,229,228 ක වියදම් දරා තිබුණි. | වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කළ යුතුවේ. | 2018 වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබූ අතර 2019 වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කරමින් පවතී. |

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 4.1 අයවැය පාලනය

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | වැය විෂයයන් 07 ක ඉතිරිවීම්වල එකතුව රු.12,924,995 ක් වූ අතර එම අගයන් සියයට 1 සිට සියයට 85 අතර පරාසයක පැවතුණි. | තාත්වික වන පරිදි වාර්ෂික ඇස්තමේන්තු පිළියෙල කළ යුතුවේ. | ඉදිරි අයවැය සකස් කිරීමේ දී අවධානය යොමුකරමි. |
| (ආ) | ආදායම් විෂයයන් 03 ක ළඟාකර නොගත් ඉලක්කවල එකතුව රු.13,706,823 ක් වූ අතර එම අගයයන් සියයට 26 සිට 58 අතර පරාසයක පැවතුණි. | තාත්වික වන පරිදි වාර්ෂික ඇස්තමේන්තු පිළියෙල කළ යුතුවේ. | ඉදිරි අයවැය සකස් කිරීමේ දී අවධානය යොමුකරමි. |

### 4.2 විගණන හා කළමනාකරණ කමිටු ක්‍රියාත්මක කිරීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2009 ජුනි 09 දිනැති අංක DMA/2009 (i) දරන කළමනාකරණ විගණන චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවා තිබුණද, සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් පවත්වා තිබුණේ රැස්වීම් 01 ක් පමණි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | මෙම වර්ෂයේ සිට විගණන කළමනාකරණ කමිටු විධිමත් පරිදි පැවැත්වීමට කටයුතු කරමි. |